# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2150/2 - 2019 නොවැම්බර් මස 18 වැනි සඳුදා - 2019.11.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: කඩු/ඉඩම්/03/146/යූඩීජ්.

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම්/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 492 සුභූතිපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බත්තරමුල්ල ගමේ (කඩුවෙල මහනගර සභා සීමාව තුළ) පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති කො. 9830 හා 2019.10.03 දින දරන මූලික පිඹුරෙහි කැබලි අංක 1 හා 2 න් පෙන්නුම් කරන ප්‍රමාණයෙන් හෙක්. 0.3221 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි දෙක (02).

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: ගොඩැල්ලවත්ත *නොහොත්* මිල්ලගහවත්ත සහ කොට්ටනුවේ කුඹුර; ඉඩම් පරිහරණය:විවෘත මුඩු බිම; හිමිකම් කියන්නා: රජය;මුල් හිමිකම් කියන්නා: නාගරික සංවර්ධන අධිකාරිය;ප්‍රමාණය: හෙක්. 0.0060.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: ගොඩැල්ලවත්ත *නොහොත්* මිල්ලගහවත්ත සහ කොට්ටනුවේ කුඹුර; ඉඩම් පරිහරණය:විවෘත මුඩු බිම;හිමිකම් කියන්නා: රජය;මුල් හිමිකම් කියන්නා: එන්.එස්.සෙනෙවිරත්න, ශාන්ත ඩෝරා පුද්ගලික රෝහල, කොට්ටාව, බත්තරමුල්ල.;ප්‍රමාණය: හෙක්. 0.3161.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 නොවැම්බර් මස 27 වැනි දින පෙ.ව. 10.00ට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2019 නොවැම්බර් මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. හිමිකම් පෑමට සහාය වන සියලුම ඔප්පු හා වෙනත් ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

ඒ.ඩී.වයි. ආනන්දනී,
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල.

2019 නොවැම්බර් මස 08 වන දින,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 04


1A - G 31469 - 17 (2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.